# මාධ්‍ය සටහන
# ජාතික ගිණුම් ඇස්තමේන්තු
# (පදනම් වර්ෂය 2002)

# **2015** පළමු වැනි කාර්තුව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර (2002) හා පවත්නා මිල යටතේ ඇස්තමේන්තු කරන ලද 2015 පළමු වැනි කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය මෙයින් ප්‍රකාශයට පත් කෙරේ.**

ශ්‍රී ලංකා ආර්ථිකයේ සමස්ථ නිෂ්පාදනය මනිනු ලබන දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) ස්ථාවර (2002) මිල ගණන් යටතේ 2014 පළමු වැනි කාර්තුවේ (ජනවාරි - මාර්තු) සිට 2015 පළමු වැනි කාර්තුව (ජනවාරි - මාර්තු) දක්වා රුපියල් මිලියන 857,497 සිට රුපියල් මිලියන 912,534 දක්වා ඉහළ යමින් සියයට 6.4ක වර්ධනයක් ලබාගෙන ඇත.

මෙහිදී කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා අංශ තුන පිළිවෙලින් සියයට 10.9ක්, සියයට 32.7ක් හා සියයට 56.3ක් ලෙස සමස්ථ දළ දේශීය නිෂ්පාදිතයට ප්‍රතිශත දායකත්වයක් ලබාදී ඇත.

2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ පළමු වැනි කාර්තුව තුළදී කෘෂිකර්මාන්ත වන වගා සහ ධීවර අංශය සියයට 0.7ක් ද, කර්මාන්ත අංශය සියයට 6.5ක් ද හා සේවා අංශය සියයට 7.5ක් ලෙසද වර්ධනයන් පෙන්නුම් කර ඇත.

කෘෂිකර්මාන්ත උප අංශය යටතේ ඇති “තේ”, “අනිකුත් ආහාර බෝග” යන නිෂ්පාදන අංශයන් සඳහා එකතු කළ අගයයන් 2014 පළමු වැනි කාර්තුවට සාපේක්ෂව පිළිවෙලින් සියයට 7.1කින් හා 4.9කින් වර්ධනය වී ඇත. එමෙන්ම “පොල්” උප අංශය සියයට 2.6ක වර්ධනයක් ලබා ඇත. “පතල් හා කැණීම්” අංශය සියයට11.3ක ද, “නිෂ්පාදන කර්මාන්ත” අංශය සියයට 6.6ක ද වර්ධනයක් පෙන්වනු ලබයි. “විදුලිය, ගෑස් හා ජලය” උප අංශය 2015 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ දී සියයට 9.5ක හා ඉදිකිරීම් උප අංශයෙහි සියයට 4.1ක වර්ධනයක් ද සිදුවී ඇත. 2014 පළමු කාර්තුවට සාපේක්ෂව 2015 පළමු වැනි කාර්තුවේ දී “තොග සහ සිල්ලර වෙළඳාම” සියයට 11.9ක ඉහළ වර්ධනයක් වාර්තා කර ඇත. “ප්‍රවාහන හා සන්නිවේදන” උප අංශය හා “බැංකු රක්ෂණ සහ නිශ්චල දේපළ” උප

අංශය පිළිවෙලින් සියයට 4.0කින් හා සියයට 5.8 කින් වර්ධනය වී ඇත. එමෙන්ම "රාජ්‍යසේවා" අංශය 2014 පළමු වැනි කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේ දී සියයට 6.9 ක ඉහළ වර්ධනයක් වාර්තා කර ඇත.

"රබර්" නිෂ්පාදනය, "සුළු අපනයන බෝග" නිෂ්පාදනය හා "ධීවර" කර්මාන්ත යන උප ආර්ථික අංශයන් 2014 පළමු වැනි කාර්තුවට සාපේක්ෂව මෙම වසරේ පළමු වැනි කාර්තුව තුළදී පිළිවෙලින් සියයට 12.8කින්, සියයට 21.1කින් හා සියයට 3.8කින් පසුබෑමකට ලක්වී ඇත.

ආර්ථිකයේ සියලු භාණ්ඩ හා සේවාවන්හි සාමාන්‍ය මිල මට්ටම නිරූපණය කරන දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය අවධමනකය (2002=100), 2014 පළමු කාර්තුවේ පැවති දර්ශකාංක 271.5 සිට 2015 පළමු වැනි කාර්තුවේ දර්ශකාංක 285.7 දක්වා ඉහළ ගොස් ඇති අතර ඒ අනුව මෙම කාර්තුව තුළ උද්ධමන අනුපාතය සියයට 5.2ක් ලෙස වාර්තා විය.

පාරිභෝගික භාණ්ඩ හා සේවාවල සාමාන්‍ය මිල මට්ටම් පිළිබිඹු කරන කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2006/2007=100), 2014 පළමු වැනි කාර්තුවේ පැවති දර්ශකාංක 177.5 සිට 2015 පළමු කාර්තුවේ දර්ශකාංක 180.1 දක්වා ඉහළ ගොස් උද්ධමන අනුපාතය සියයට 1.4ක් ලෙස වාර්තා විය.

## කෘෂිකර්මාන්ත අංශය

කෘෂිකර්මාන්ත, සත්ව නිෂ්පාදන, හා වන වගාව යන කෘෂිකර්මාන්ත අංශය 2015 පළමු වැනි කාර්තුවේ දී සියයට 1.3ක වර්ධනයක් වාර්තා කර ඇත. ධීවර උප අංශය සියයට 3.8කින් පහළ බැස ඇත.

මෙම කාර්තුවේ "තේ" සඳහා එකතු කළ අගය සියයට 7.1ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. යහපත් කෘෂිකාර්මික ක්‍රමවේදයන් හඳුන්වා දීමත් යහපත් කාලගුණ තත්වයක් පැවතීමත් නිසා 2014 පළමු වැනි කාර්තුවේ 2.3ක පහළ යාමට සාපේක්ෂව මෙම කාර්තුවේ දී තේ නිෂ්පාදනය වැඩිවී ඇත.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්තා වලට අනුව වැඩි වශයෙන් රබර් වගාකරන ප්‍රදේශ වල පැවති වැඩි වර්ෂාපතනය හා රබර් මිල පහත වැටීම නිසා 2015 පළමු වැනි කාර්තුවේ දී රබර් නිෂ්පාදනය පහත වැටී ඇත. රබර් නිෂ්පාදනයෙහි එකතු කළ අගය මෙම කාර්තුව තුළ සියයට 12.8ක පසුබැසීමකට ලක්වී ඇත. 2014 වසරේ පළමු කාර්තුවේ එය සියයට 1.1ක පසුබැසීමක් ලෙස වාර්තා විය. ලෝක වෙළඳපොළෙහි ශ්‍රී ලංකාවේ ස්වභාවික රබර් සඳහා ඇති ඉල්ලුම පහළ යාම නිසා රබර් කිරි කැපීම අඩුවී ඇත.

2014 මුල් කාර්තුවේ සියයට 6.7ක වර්ධනයක් පෙන්වූ “පොල්” නිෂ්පාදන උප අංශයෙහි එකතු කළ අගය මෙම වසරේ මුල් කාර්තුවේ දී සියයට 2.6ක වර්ධනයක් වාර්තා කරයි. පොල් සංවර්ධන අධිකාරියේ වාර්තා වලට අනුව පොල් වගාකරන ප්‍රදේශ වල පැවති හිතකර කාලගුණ තත්ත්වයන් පොල් නිෂ්පාදනය ඉහළයාමට බලපා ඇත. මෙම කාර්තුව තුළ පොල් නිෂ්පාදනය සියයට 1.5කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම “රා” නිෂ්පාදනය ද 2014 මුල් කාර්තුව හා සසඳන කළ 2015 මුල් කාර්තුවේ දී සියයට 10.8ක සැළකිය යුතු වර්ධනයක් පෙන්වයි.

2014 වසරේ මුල් කාර්තුවේ සියයට 3.1ක පසුබැසීමක් පෙන්වූ සුළු අපනයන බෝග උප අංශය මෙම වසරේ පළමු වැනි කාර්තුවේ තවදුරටත් සියයට 21.1ක පසුබැසීමක් පෙන්නුම් කර ඇත.

“වී” නිෂ්පාදන උප අංශයෙහි එකතු කළ අගය 2014 මුල් කාර්තුවේ 5.7ක අඩුවීමට සාපේක්ෂව මෙම කාර්තුවේ සියයට 0.8ක වර්ධනයක් පෙන්වයි. පසුගිය (2013/14 ) මහ කන්නයේ සියයට 16.5ක අඩුවීම හා සසඳන කළ (2014/15) මහ කන්නයේ “වී” වගාකළ බිම් ප්‍රමාණය සියයට 17.0ක වැඩවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත.

“සත්ව නිෂ්පාදන” උප අංශය 2014 පළමු වැනි කාර්තුවේ සියයට 3.1ක වර්ධනයට සාපේක්ෂව 2015 පළමු වැනි කාර්තුවේ දී සියයට 0.4ක සුළු අඩුවීමක් පෙන්වා ඇත.

මෙම වසරේ පළමු වැනි කාර්තුවේ දී “ගොඩ ගොවිතැන් බෝග”, “එළවළු” හා “පළතුරු” උප අංශ අයත් වන “වෙනත් ආහාර බෝග” අංශයෙහි සියයට 4.9ක වර්ධනයක් වාර්තා

විය. "ගොඩ ගොවිතැන් බෝග" උප අංශයෙහි නිෂ්පාදන වල එකතු කළ අගය සියයට 12.3කින් වර්ධනය වී ඇත. "එළවළු" නිෂ්පාදන උප අංශයෙහි එකතු කළ අගය සියයට 0.8ක වර්ධනයක් සහ "පළතුරු" නිෂ්පාදන උප අංශයෙහි එකතු කළ අගය සියයට 0.8ක අඩුවීමක් ලෙස මෙම කාර්තුව තුළදී දැක ගැනීමට හැකිය.

මෙම කාර්තුව තුළ වැවිලි බෝග සංවර්ධනය අංශය යටතේ 2014 පළමුවන කාර්තුවේ සියයට 7.4ක පසුබෑමට සාපේක්ෂව 2015 පළමු වැනි කාර්තුව තුළ සියයට 2.1ක වර්ධනයක් වාර්තා කරයි.

"දැව හා වන" උප අංශය 2015 පළමු කාර්තුවේ දී සියයට 1.6ක වර්ධනයක් වාර්තා කරන අතර, 2014 පළමු කාර්තුවේ දී මෙම අංශය සියයට 5.9ක අඩුවීමක් වාර්තා කර ඇත.

2015 පළමු කාර්තුවේ සමස්ථ "ධීවර" නිෂ්පාදනය සියයට 3.8ක පසුබෑමක් දක්නට ඇත. පසුගිය වසරේ පළමු කාර්තුව තුළ සියයට 95.7ක ඉහළ වර්ධනයක් පෙන්වූ "මිරිදිය ධීවර" අංශය මෙම කාර්තුව තුළ සියයට 28.6ක පසුබෑමක් පෙන්වා ඇත. ධීවර අමාත්‍යාංශ වාර්තා අනුව 2014 වර්ෂයේ පැවති අයහපත් කාලගුණ තත්වයන් හේතුවෙන් වසර අවසානයේ වැඩිපුර මත්ස්‍ය අස්වැන්නක් නෙලා ගැනීමක් සිදුවී ඇති අතර ජලාශ වලට මත්ස්‍ය ඇඟිල්ලන් මුදාහැරීමේ කටයුතු වලද අඩුවීමක් සිදුවී තිබීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී ඇත. 2014 පළමු වැනි කාර්තුවේ සියයට 6.2කට සාපේක්ෂව 2015 පළමු කාර්තුව තුළ "කරදිය ධීවර" මත්ස්‍ය නිෂ්පාදනය සියයට 0.2 කින් ඉහළ ගොස් ඇත.

## කර්මාන්ත අංශය

දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 32.7ක දායකත්වයක් සපයන "කර්මාන්ත" අංශය 2015 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ දී සියයට 6.5කින් වර්ධනය වී ඇත. 2014 වර්ෂයේ අදාල කාර්තුවේ දී එම අංශය සියයට 12.6කින් වර්ධනය වී තිබිණ. මෙම අංශයට සියයට 54.3කින් දායක වන "නිෂ්පාදන කර්මාන්ත" අංශය අදාල කාර්තුවේ දී සියයට 6.6කින් වර්ධනය වී ඇත.

2015 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ දී “පතල් සහ කැණීම්” අංශය සියයට 11.3කින් වර්ධනය වී ඇති අතර ඒ යටතේ “මැණික් කැණීම්” අංශය සියයට 17.2කින් සහ “අනිකුත් කැණීම්” අංශය සියයට 9.4කින් වර්ධනය වී ඇත. මැණික් අපනයන වටිනාකම 2015 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ දී සියයට 35.0කින් ඉහළ ගොස් ඇති අතර අපනයන ප්‍රමාණය සියයට 18.0 කින් ඉහළ ගොස් ඇත.

“නිමැවුම් කර්මාන්ත” අංශය තුළ “සැකසුම් කර්මාන්ත” අංශය මෙම කාර්තුවේ දී සියයට 3.8කින් වර්ධනය වී ඇත. රබර් නිෂ්පාදනයේ සිදුවූ පසුබැසීම, මෙම සැකසුම් කර්මාන්ත අංශයේ මන්දගාමී වර්ධනයට ප්‍රධාන හේතුව විය.

“කර්මාන්ත ශාලා” නිෂ්පාදන අංශය 2015 පළමු වැනි කාර්තුවේ දී සියයට 7.0කින් වර්ධනය විය. එම අංශය තුළ වැඩිම දායකත්වයක් සපයන “ආහාරපාන සහ දුම්කොළ” නිෂ්පාදන උප අංශය සහ “රෙදිපිළි ඇඟළුම් හා සම්භාණ්ඩ” නිෂ්පාදන උප අංශය පිළිවෙලින් සියයට 9.6කින් සහ 10.4කින් වර්ධනය විය.

“විදුලිය, ගෑස් හා ජලය” යන උප අංශය 2015 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ දී සියයට 9.5කින් වර්ධනය වී ඇත. එයට හේතු වී ඇත්තේ එම අංශයට දායකත්වය සපයන සියලුම අංශ වල සිදුවී ඇති වර්ධනයයි. එනම් “විදුලිය”, “ගෑස්” හා “ජලය” යන උප අංශ පිළිවෙලින් සියයට 9.1කින්, 19.1කින් හා සියයට 1.5කින් වර්ධනය වීම සහ විදුලිබල උත්පාදන අංශයේ වාර්තා වූ සියයට 4.8ක වර්ධනයයි. 2014 වර්ෂය හා සසඳන කළ ජල විදුලිබල නිෂ්පාදනය සියයට 83.0 කින් ඉහළ ගොස්ඇති අතර තාප විදුලි බල නිෂ්පාදනය සියයට 22.0 කින් අඩුවී ඇත. 2015 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ දී සහ ඊට පෙර කාර්තුවේ අවසාන මාස වලදී ජලවිදුලි බලාගාර ආශ්‍රිත පෝෂක ප්‍රදේශ වල පැවති වැසි සහිත කාලගුණය, ජල විදුලිබල නිෂ්පාදනය වැඩි වීමට හේතු වී අතර, 2014 වර්ෂයේ පළමුවැනි කාර්තුව සඳහා ජල විදුලිබල ජනනය සහ තාප විදුලි බල ජනනය අතර පැවති 26:74 අනුපාතය 2015 වර්ෂයේ පළමු වැනි කාර්තුවේදී 45:55 ලෙස වෙනස් වී ඇත.

2015 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ දී "ඉදිකිරීම්" අංශය සියයට 4.1ක වර්ධනයක් වාර්තා කර ඇති අතර, 2014 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ දී එය සියයට 22.5ක වර්ධනයක් ලෙස පැවතිණ.

## සේවා අංශය

දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 56.3ක ඉහළ දායකත්වයක් සපයන "සේවා" අංශය 2015 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ දී 2014 වර්ෂයේ පළමු වැනි කාර්තුවට සාපේක්ෂව සියයට 7.5කින් වර්ධනය වී ඇත. 2014 පළමු වැනි කාර්තුවේ දී මෙම අංශය සියයට 6.5 කින් වර්ධනය විය. මෙම අංශයට ඉහළ දායකත්වයක් ලබා දෙන "තොග හා සිල්ලර වෙළඳාම්" අංශය 2015 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ දී සියයට 11.9ක ඉහළ වර්ධනයක් වාර්තා කරන අතර, සේවා අංශය සඳහා සියයට 40.6ක ඉහළ දායකත්වයක් සපයන තොග හා සිල්ලර වෙළඳාම් අංශය 2014 පළමු වැනි කාර්තුව සඳහා සියයට 8.3ක වර්ධනයක් වාර්තා කර ඇත.

මෙහි ප්‍රධාන උප අංශය වන "ආනයන වෙළඳාම", "අපනයන වෙළඳාම" හා "දේශීය වෙළඳාම" යන අංශ පිළිවෙලින් සියයට 19.0ක් සියයට 2.9ක් හා සියයට 10.8 ක් ලෙස පසුගිය වසරේ පළමු වැනි කාර්තුවට සාපේක්ෂව වර්ධනය වී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛන අනුව 2014 පළමු වැනි කාර්තුවේ පැවති රුපියල් මිලියන 368,151 ක අපනයන ආදායම 2015 පළමු කාර්තුව වන විට රුපියල් මිලියන 378,918 දක්වා සියයට 2.9කින් වැඩි වී ඇත. 2014 වසරේ පළමු වැනි කාර්තුවට සාපේක්ෂව 2015 වසරේ පළමු වැනි කාර්තුවේ දී කෘෂිකාර්මික හා ඛනිජමය අපනයන සියයට 5.1කින් හා සියයට 73.0කින් පහළ ගොස් ඇති අතර කාර්මික නිෂ්පාදන අපනයන ආදායම සියයට 6.8කින් ඉහළ ගොස් ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළඳ දර්ශක අනුව 2015 පළමු වැනි කාර්තුවේ දී අපනයන හරිත දර්ශකය සියයට 3.3කින් ඉහළ ගොස් ඇති අතර ඒකක මිල දර්ශකය සියයට 0.3 කින් පහළ ගොස් ඇත.

2014 පළමු වැනි කාර්තුවේ දී සියයට 4.6ක සුළු වර්ධනයක් පෙන්වූ "ආනයන වෙළඳාම්" අංශය, 2015 පළමු වැනි කාර්තුවේ දී සියයට 19.0ක ඉහළ වර්ධනයක් වාර්තා කර ඇත. ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛන අනුව අදාල කාර්තුවේ දී මුළු ආනයන වියදම රුපියල් මිලියන 620,660 සිට රුපියල් මිලියන 634,338 දක්වා සියයට 2.2කින් වර්ධනය වී ඇත. 2015 පළමු වැනි කාර්තුව තුළ දී ආනයන පරිමා දර්ශකය සියයට 16.5කින් වර්ධනය වී ඇති අතර ඒකක මිල දර්ශකය සියයට 12.3කින් පහළ ගොස් ඇත.

2014 පළමු වැනි කාර්තුවේ සියයට 8.3කින් වර්ධනය වූ "දේශීය වෙළඳාම්" අංශය මෙම වර්ෂයේ පළමුවන කාර්තුවේ ද තව දුරටත් සියයට 10.8 කින් වර්ධනය වී ඇත.

2015 පළමුවැනි කාර්තුවේ දී හෝටල් හා ආපනශාලා අංශයේ එකතු කළ අගය සියයට 2.6ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2015 පළමු වැනි කාර්තුවේ දී සංචාරක පැමිණීම 478,838ක් ලෙස වාර්තා වී ඇති අතර, ඒ සඳහා 2014 පළමු වැනි කාර්තුවේ දී වාර්තා වී ඇත්තේ 421,501කි. ඒ අනුව පසු ගිය වර්ෂයේ අදාළ කාර්තුවට සාපේක්ෂව සංචාරක පැමිණීම සියයට 13.6 කින් වැඩි වී ඇත.

"ප්‍රවාහන සහ සන්නිවේදන" උප අංශයෙහි පසුගිය වර්ෂයේ පළමු වැනි කාර්තුවේ වාර්තා වූ සියයට 7.3 ක වර්ධනයට සාපේක්ෂව මෙම කාර්තුව තුළ සියයට 4.0 ක වර්ධනයක් සඳුවී ඇත. මෙම උප අංශය යටතේ "මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය", "බහාලුම් මෙහෙයුම් සහ සිවිල් ගුවන් සේවා" සහ "තැපැල් සහ විදුලි සංදේශ" යන උප අංශයන් පිළිවෙලින්, සියයට 3.5ක්, සියයට 7.3ක්, සහ සියයට 6.8ක් වශයෙන් වර්ධනයන් පෙන්වා ඇත.

2014 පළමු වැනි කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළ නව බස් රථ හා මෝටර් රථ ලියාපදිංචි කිරීම් පිළිවෙලින් සියයට 187.9ක සහ සියයට 192.8ක වර්ධනයක් පෙන්නුම් කරයි. එසේම 2014 පළමු කාර්තුවට සාපේක්ෂව ජාතික ගමනා ගමන මණ්ඩලයේ ආදායම සියයට 5.25කින් සහ මගී කි.මි. ප්‍රමාණය සියයට 15.05කින් ද වර්ධනය වී ඇත.

වරාය ආශ්‍රිත කටයුතු වලදී "බහාලුම් මෙහෙයුම්" සියයට 4.7ක වර්ධනයක් පෙන්වයි. "ශ්‍රී ලංකන්" ගුවන් සමාගමේ ආදායම සියයට 9.8කින් වැඩි වී ඇති අතර මගී කි.මී.ප්‍රමාණය සියයට 7.7කින් වර්ධනය වී ඇත.

"බැංකු, රක්ෂණ හා නිශ්චල දේපළ අංශය" 2015 පළමු වැනි කාර්තුවේ දී සියයට 5.8කින් වර්ධනය විය. පෙර වර්ෂයේ අදාළ කාර්තුවේ දී මෙම අංශයෙහි සියයට 5.1ක වර්ධනයක් වාර්තා වී තිබිණ. අදාළ කාර්තුවේ දී "හරිත සාමාන්‍ය ණය පොළී අනුපාතිකය" සහ "හරිත සාමාන්‍ය තැන්පතු පොළී අනුපාතිකය" පිළිවෙළින් සියයට 11.5ක් සහ 5.8ක් ලෙස වර්ධනයක්ව පැවතිණ. පෙර වර්ෂයේ පළමු කාර්තුවේ දී එම අනුපාතය සියයට 11.7 ක සහ 20.9 ක අඩුවීමක් ලෙස පැවති අතර. බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන රැසක බදුවලට පෙර ලාභය සැළකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත.


**ජාතික ගිණුම් අංශය- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**දුරකථන:094-011-2147058, ෆැක්ස්:094-011-2147059**

**ඊ මේල්:national.accounts@statistics.gov.lk**

**අන්තර්ජාල වෙබ් අඩවිය : www.statistics.gov.lk**